රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 03/2018

මගේ අංකය : PSC/DP/2011/21

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

අංක 1200/9, රජමල්වත්ත පාර,

බත්තරමුල්ල.

2018.07.30

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරීන් සඳහා විනය දඬුවම් පැනවීම.</u>**

නොනිමි විනය කරුණු පවතින නිලධාරියකු අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹී විට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත්ව විශ්‍රාම ගන්වනු ලබන අතර එම විනය ක්‍රියාමාර්ගය අවසානයේ අදාළ චෝදනාවලට වරදකරු වුවහොත් එම නිලධාරියා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ ඉදිරි කටයුතු කරනු ලැබේ.

02 ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 23:9 වගන්තිය අනුව කිසියම් දඬුවමක් ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකිය යුත්තේ අදාළ වරද කළ දිනයි. ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරියෙකු සම්බන්ධයෙන් ද දඬුවම් ලෙස විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් යම් කිසි අඩු කිරීමක් කළද එම දඬුවම ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකිය යුත්තේ ද වරද කළ දිනය වේ.

03. එබැවින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරීන්ට විශ්‍රාම ගන්වන දිනට පූර්වාසන්න වසර 5ක සතුටුදායක සේවා කාලයක් ඇත්නම් එම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප හා විශ්‍රාම පාරිතෝෂිකය කෙරෙහි බලපාන විනය දඬුවම, නිලධාරියාගේ අනිකුත් විශ්‍රාමික ප්‍රතිලාභ කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04. මේ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් මෙම කොමිෂන් සභාවට දැන්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.